**ශීර්ෂය 271 - ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූලි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**---------------------------------------------**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඡෙද යොමුව | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
| --- | --- | --- |
| 1.6.4 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5.2.1 ඡේදයේ විධිවිධාන පරිදි රු.825, 600 ක නිවාස කුලි අයකර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව නිවාස කුලී අයකල යුතුය. |
| 1.6.4 (ඇ) | 2017 දෙසැම්බර් 21 දිනැති මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යංශයේ අංක 02/2017 දරන චක්‍රලේඛය ප්‍රකාරව මූතූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබෙන වාහන 7ක ලියාපදිංචි අයිතිය එම ආයතනය සතුව නොතිබු අතර චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ලියාපදිංචි අයිතිය ලබා ගැනීමටද කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි ක්‍රියාකළ යුතුය. |
| 2.4 | 2018 අප්‍රේල් 18 දිනැති අංක 24/2017 දරන දේශීය ආදායම් පනතේ 85 වගන්තිය අනුව 2018 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය වෙනුවෙන් සේවා නියුක්තිකයන්ගේ අයකර ගත යුතුව තිබුණු රු.176,567 ක උපයන විට බද්ද සේවා නියුක්තිකයන්ගෙන් අයකරගෙන දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට යවා නොතිබුණි. | දේශීය ආදායම් පනත අනුව උපයනවිට ගෙවීම් බදු සේවා නියුක්තිකයන්ගෙන් අයකළ යුතුය. |
| 3.4 (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවා කාලය වර්ෂ 05 ක් ඉක්මවා සිටින නිලධාරීන් සම්බන්ධයෙන් ස්ථාන මාරු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර නොතිබීම නිසා නගරයෙන් දුර බැහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දීර්ඝ කාලයක සිට ස්ථාන මාරු අපේක්ෂාවෙන් සිටින නිලධාරීන්ට අසාධාරණයක් සිදු වී තිබුණි . | ස්ථාන මාරු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය |

| | | |
|---|---|---|
| 3.4 (ඇ) | සමාලෝචිත වර්ෂයේ මාර්තු සිට 2020 මාර්තු දක්වා කාලයට අදාළ වන දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ රු.1,350,260 ක ඇමඳුම් සේවා වියදම් (271-01-01-1303) රජයේ ගොඩනැඟිලි කුලි ආදායමෙන් (2002-01-01) ගෙවීම නිසා ඇමඳුම් සේවා වියදම මෙන්ම රජයේ ගොඩනැඟිලි කුලී ආදායමද රු.1,350,260 කින් අඩුවෙන් දැක්වීමක් සිදු වී තිබුණි. | රාජ්‍ය ආදායම හා වියදම් නිවැරදිව ගිණුම්ගත කිරීමට ක්‍රියාකළ යුතුය. |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) පුනරාවර්තන වියදම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | පිරිසිදු කිරීම් සේවා සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ගෙවා ඇති රුපියල් 2,712,740 ක් අනෙකුත් සේවා වැය ශීර්ෂ අංක 271-1-1-0-1409 යටතට ඇතුලත් කළ යුතු වුවත් එම වියදම ගොඩනැගිලි නඩත්තු වියදම් ශීර්ෂ 271-1-1-0-1303 යටතේ ගිණුම්ගත කර තිබුණි. | එකඟ වෙමි.<br>2020 වර්ෂය සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදී 271-1-1-0-1303 වැය ශීර්ෂය යටතේ පිරිසිදු කිරීම් සේවා ඇස්තමේන්තු කර ඇත. | වැය ශීර්ෂ නිවැරදිව හඳුනා ගෙන ගිණුම් ගත කිරීම සිදු කළ යුතුය. |
| (ii) | 2020 වසරේ කුලී ආදායම් මගින් රැස්කර ඇති ආදායම් පොදු තැන්පත් ගිණුමට බැර කර එයින් එකතුව රුපියල් 678,740 ක් පිරිසිදු කිරීම් සේවා සඳහා ගෙවීම් කර තිබීම හේතුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පිරිසිදු කිරීමේ සේවා වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | එකඟ වෙමි.<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පිරිසිදු කිරීමේ වියදම එලෙස ගිණුම් ගත වී තිබුණි. | වියදම් නිවැරදිව හඳුනාගෙන අදාළ වැය විෂයයන්ට ගැලපීම සිදු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | භාණ්ඩාගාර මුද්‍රිත සටහන් (SA- 90), අනුව සමාලෝචිත වර්ෂයට අදාලව වියදම් ශීර්ෂ 9165-0- 0-271-0-0-0 යටතේ රුපියල් මිලියන 1638.45 ක් බැරකම් ලෙස සටහන් වන නමුත් එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | එකඟ වෙමි. CIGAS වැඩසටහන සකස් කිරීමේදී සිදු වූ අත්වැරද්දක් නිසා එවැනි බැරකමක් පෙන්වුවද සත්‍ය වශයෙන්ම එවැනි බැරකමක් සිදු වී නොමැත. | මූල්‍ය ප්‍රකාශන තුල නිවැරදි හා සම්පූර්ණ තොරතුරු ඇතුලත් කළ යුතුය. |

(ආ) තැන්පතු
----------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වසර තුලදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රජයේ ආයතන 15 කින් එකතු කරන ලද කුලි ආදායම් හා නඩත්තු ගාස්තු වන රුපියල් 1,093,800 ක් රජයේ ගොඩනැගිලි කුලී ආදායම් ශීර්ෂයට බැර නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | කුලී ලෙස, අය කළ මුදලින් ඒ ඒ දෙපාර්තමේන්තු වල ඇමදුම් ගාස්තු පමණක් ගෙවා ඇත. රජයේ නොවන කිසිදු ආයතනයකින් නඩත්තු වියදම් අයකර ඇමදුම් සේවා සඳහා ගෙවීම් කර නොමැත. | රජයේ ආදායම් නිවැරදි ශීර්ෂය යටතේ හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය. |

(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම
-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | **විදුලි උපකරණ පිළිබඳ ලේඛනය**<br>මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් ගෝමරන්කඩවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පවත්වා නොතිබුණි. | එකඟ වෙමි. ලේඛන සහ පොත් පත් යාවත්කාලීන කරගෙන පවත්වා ගෙන යාමට උපදෙස් දී ලබා දී ඇත. | මුදල් රෙගුලාසි වලට අනුව ලේඛන පවත්වා ගෙන යා යුතුය. |
| (ii) | **නිවාඩු පිළිබඳ ලේඛනය**<br>ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 1.7 වගන්තිය ප්‍රකාරව නිවාඩු පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | ලේඛන සහ පොත් පත් යාවත්කාලීන කරගෙන පවත්වාගෙන යන ලෙසට උපදෙස් දී ලබා දී ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව නිවාඩු ලේඛනයක් පවත්වා ගෙන යා යුතුය. |

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 අග්‍රිම කළමනාකරණය
-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අග්‍රීම නිදහස් කිරීම සම්බන්ධව භාණ්ඩාගාර උපදෙස්හි 03 වන වගන්තිය අනුව, නිදහස් කර ඇති අග්‍රීම අපේක්ෂිත අරමුණු සඳහා පමණක්ම භාවිතා කළ යුතු අතර වෙනත් වියදම් අරමුණු සඳහා භාවිතා නොකළ යුතු නමුත් ග්‍රාමීය නිවාස ඉදිකිරීම් හා ඉදිකිරීම් අමුද්‍රව්‍ය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයෙන් හා සමෘද්ධි, ගෘහආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා සහ ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයෙන් ලද රුපියල් මිලියන 63.99 ක අග්‍රීම මුදල් අදාල අරමුණ සඳහා උපයෝජනය නොකර වෙනත් අරමුණු සඳහා භාවිතා කර තිබුණි. | එකඟ වෙමි.<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලැබෙන ප්‍රතිපාදන අනුව වරින් වර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් අග්‍රිමය ඉල්ලුම් කළ ද ඉල්ලුම් කරන ලද පිළිවෙළටම එම අග්‍රිමය නොලැබෙන බැවින් ප්‍රමුඛතාවය හා හදිසි අවශ්‍යතාව සලකා ලද අග්‍රිමය එම මොහොතේ ප්‍රමුඛතාවය ලබාදිය යුතු වියදම් දැරීම සඳහා කළමනාකරණය කර ඇත. | ලැබෙන අග්‍රිම අදාළ කාර්යය සඳහා පමණක් යෙදවීමට අවධානය යොමු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා රුපියල් මිලියන 3.014 ක අග්‍රීම ඉල්ලා තිබුණ ද රුපියල් මිලියන 2.667 ක අග්‍රීම පමණක් ලැබීම හේතුවෙන් ඉල්ලා ඇති අග්‍රීම හා ලැබුණු අග්‍රීම අතර වෙනස රුපියල් මිලියන 347.52 ක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂය අවසානයේදී රුපියල් මිලියන 196.68 ක් ගෙවිය යුතු බිල්පත් ලෙස දක්වා තිබුණි. | එකඟ වෙමි.<br>සමාලෝචිත වර්ෂය සඳහා ඉල්ලුම් කරන ලද අග්‍රිම ප්‍රමාණයම නොලැබෙන බැවින් වර්ෂ අවසානයේ දී ගෙවීම් කළ නොහැකි සියලු බිල්පත් අතැති බිලපත්ද ලෙස දක්වා ඇත. | අග්‍රිම ඉල්ලුම්පත් කාලීනව ඉදිරිපත් කර අග්‍රිම ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

2.2 අධිවැය

--------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 මාර්තු 31 දිනැති සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල්ගේ 08/2017 දරන ගිණුම් චක්‍රලේඛයට අනුව මූතූර් සහ මොරවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අයත් මියගිය, විවාහක සහ විදේශ රැකියා සඳහා විදේශ ගත වූ පුද්ගලයින් සිටින පවුල් පිළිවෙලින් 11 ක් සහ 06 ක් සඳහා රුපියල් 136,000 සහ රුපියල් 83,000 ක් වශයෙන් සමෘද්ධි දීමනාව සඳහා සුදුසුකම් නොලබන පවුල් සඳහා සමෘද්ධි දීමනා වැඩිපුර ගෙවා තිබුණි. | එකඟ වෙමි.<br><br>මෙම මුදල් අයකරගැනීමට කටයුතු සිදුකරනු ඇත. | චක්‍රලේඛ විධි විධාන අනුව ක්‍රියා කළ යුතුය. |
| (ආ) | සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල්ගේ 2017 මාර්තු 31 දිනැති අංක 08/2017 දරන ගිණුම් චක්‍රලේඛයේ 1.6 ඡේදයට අනුව, සහනාධාරලාභී පවුලක සාමාජිකයකුට රජයේ රැකියාවක් ලැබුනහොත් එම සහනාධාරය වහාම අවලංගු කළ යුතු වුවත් මූතූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එලෙස සහනාධාර අවලංගු නොකරන ලද පවුල් 04 ක් සඳහා රු.166,000 ක් ගෙවා තිබුණි. | ප්‍රතිලාභීන් තෝරාගැනීමේදී හා ගෙවීම් සිදු කිරීමේ දී ලිපි ලේඛන පරීක්ෂාවේදී හා යාවත්කාලීන කිරීමේදී සිදු වූ අතපසුවීමක් නිසා නිවැරිදි නොවන අයට සමෘද්ධි ප්‍රතිලාබ ලබාදීම සිදු වී ඇත. | චක්‍රලේඛයට පටහැනිව ගෙවන ලද මුදල් නැවත අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

---------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මු.රෙ. 94(1) සහ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ 2017 අප්‍රේල් 27 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 255/2017 අනුව බැදීම්, බැරකම් හා වියදම් සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන නොඉක්මවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාලව පුනරාවර්තන වියදම් 4 ක් හා ප්‍රාග්ධන වියදම් 10 ක් සඳහා පිළිවෙලින් රුපියල් මිලියන 33.62 ක් සහ රුපියල් මිලියන 96.60 ක් ලෙස ලද ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා තිබුණි. | එකඟ වෙමි.<br>එම පුනරාවර්තන වියදම් තුල වැටුප්, දීමනා. ගර්භනී මව්වරුන්ගේ ගෙවීම් හා පෝෂණ දීමනා ආදිය ඇතුලත්ව ඇත. එම ගෙවීම් අඛණ්ඩව කළ යුතු අත්‍යාවශ්‍ය ගෙවීම් බැවින් අඛණ්ඩව ගෙවීම් සිදු කිරීමට සිදු ව ඇත. එමෙන්ම රු. මිලියන 96.60 | චක්‍රලේඛ උපදෙස් පරිදි බැදීම්, බැරකම් හා වියදම් ප්‍රතිපාදන වටිනාකම නොඉක්මවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අවිච්චින්න ව ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන අපේක්ෂාවෙන් ගෙවීම් සිදු කිරීමට වීම නිසා ප්‍රාග්ධන වියදම් ඉක්මවා ඇත. | |

2.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 208 ප්‍රකාරව යම් දෙපාර්තමේන්තුවක් වෙත වෙන් කරන ප්‍රතිපාදන උපරිම භාවිතයක් ලැබෙන පරිදි යොදවා ගැනීමට සෑම ගණන්දීමේ නිළධාරි යකුගේම වගකීමක් වුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්තව ඇති අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 5 ක් වෙනුවෙන් වෙන්කරන ලද ප්‍රතිපාදන එකතුව රුපියල් මිලියන 217.14 ක් හා දරන ලද වියදම රුපියල් මිලියන 108.31 ක් වූයෙන් ප්‍රතිපාදන වල ඉතිරිය රුපියල් මිලියන 108.83 ක් විය. එම හේතුවෙන් වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනවල ඉතිරිය සියයට 31 සිට සියයට 97 දක්වා පරාසයක පැවතුණි. | එකඟ වෙමි.<br>2020 වර්ෂය තුළ රට තුළ ඇති වූ කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දෙන ලද ප්‍රතිපාදනයන් වෙන් වූ අදාල කාර්යයන් බොහෝමයක් ක්‍රියාත්මක නොවීම නිසා මෙන්ම ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ලැබුණද අග්‍රිමය නොලැබීම හේතුවෙන් ප්‍රතිපාදන වල ඉතිරි කිරීම් දක්නට ලැබුණි. | ලැබෙන ප්‍රතිපාදන වලින් උපරිම ප්‍රයෝජන ලබා ගත හැකිවන පරිදි සැළසුම් සකස් කළ යුතුය. |
| (ආ) | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 4 කින් ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් ලැබී තිබූ රුපියල් මිලියන 33.10 ක ප්‍රතිපාදන අදාල අරමුණ සඳහා භාවිතා නොකිරීම නිසා මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | එකඟ වෙමි.<br>2020 වර්ෂය තුළ රට තුළ ඇති වූ කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් බොහෝමයක් ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම නිසා ප්‍රතිපාදන ඉතුරු වී ඇත. | ලැබෙන ප්‍රතිපාදන වලින් උපරිම ප්‍රයෝජන ලබා ගත හැකිවන පරිදි සැළසුම් සකස් කළ යුතුය. |

2.5 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණ සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේ දී පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳ සමාලෝචනයක් සිදු කර එහි ලිඛිත පිටපත විගණනයට ඉදිරිපත් කරමි. | ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | | |
| | | රු. | | | |
| I. | 2016 අප්‍රේල් 11 දිනැති අංක 06/2016 දරන කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛය | 13,377,000 | කන්තලේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ගර්භනි මවුවරුන්ට රුපියල් 20,000ක පෝෂණ දීමනාව ලබාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරිමේ හා අධීක්ෂණය කිරීමේදි ලියාපදිංචි කර ගනු ලබන වෙළඳ ආයතන විසින් නිර්දේශිත ආහාර පමණක් නිකුත් කරන බවට හා ඒවායේ ගුණාත්මක භාවය පිළිබඳ පරික්ෂා කිරිම පිලිබඳව අඛණ්ඩ යාන්ත්‍රණයක් සකස් කර නොතිබුණු අතර 2020 වර්ෂයට අදාලව මේ සම්බන්ධව කිසිදු වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | කන්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මෙම ලියාපදිංචි ආයතන වල ඉදිරියේදී ගුණාත්මක භාවය පිළිබඳ පරීක්ෂා කිරීමට විධිමත් යාන්ත්‍රණයක් සකස් කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| II. | 2006 සමහ සංයෝජිතව කියවිය යුතු 2020 මාර්තු 25 දින නිකුත් කරන ලද ප්‍රසම්පාදන අත් පත්‍රිකාවේ 3.5 හා 3.6 වගන්තිය | 641,317 | මෝටර් වාහන සහ අනෙකුත් උපකරණ අළුත්වැඩියා කිරීමේදී රු.200,000 සීමාව ඉක්මවන අළුත්වැඩියාවන් සඳහා ප්‍රධාන ගණන්දීමේ නිළධාරීයාගේ පෞද්ගලික අනුමැතිය ලබා ගත යුතු වුවත් ඊට පටහැනිව මොරවැව හා ගෝමරන්කඩවල | අභ්‍යන්තර, ස්වදේශ කටයුතු, සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක HA/F/07/VEREP/ Common/ Vol-03 හා 2019-10-30 දිනැති ලිපිය මගින් ලබා දී ඇති උපදෙස් ද මෙහි දී සලකා බලා ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මෝටර් වාහන අළුත්වැඩියා වෙනුවෙන් 2020 වර්ෂයේ දී රුපියල් 41,317 ක අළුත්වැඩියා වියදම් දරා තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම
--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ කාර්යසාධන බලකා ව්‍යාපෘතිය යටතේ පුල්මුඩේ - 3 RB ක්‍රිඩාංගනය සඳහා ක්‍රීඩා මධ්‍යස්ථානයක් ඉදිකිරීම නම් වූ කොන්ත්‍රාත්තුව ඉටු කර ගැනීම සඳහා 2019 අගෝස්තු 6 දින කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් විසින් පුල්මුඩේ මුස්ලිම් මහ විද්‍යාලයේ පාසල් සංවර්ධන සමිතිය සමඟ ගිවිසුමකට එළඹී තිබුණු අතර, එම ගිවිසුමට අනුව, එදින සිට දින 90 ක් තුළ එම කොන්ත්‍රාත්තුවේ වැඩ නිම කළ යුතු වුවත්, 2020 සැප්තැම්බර් 10 දින වන විට එහි වැඩ කටයුතු ආරම්භ කර නොතිබුණි. | එකඟ වෙමි.<br><br>එම කාලවකවානුවේදී පැවැති අසාමාන්‍ය අයහපත් කාලගුණ වාතාවරණය හා අඛන්ඩව වැටුණු වර්ෂාව නිසා එම ක්‍රීඩාංගනයේ ජලය රැදී තිබුණු නිසාත් ඉදිකිරීම් කටයුතු ඇරඹීමට නොහැකි විය. | ගිවිසුම් ගත කාලය තුල ඉදිකිරීම් නිම කිරීම කළ යුතුය. |
| (ආ) | කුච්චවේලි ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ගම්පෙරලිය වැඩසටහන යටතේ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති අනුව කට්ටුක්කුලම ඇල මාර්ග පද්ධතිය ඉදිකිරීම කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් 2019 නොවැම්බර් 11 දින කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් විසින් කොන්ත්‍රාත්තුව ඉටුකර ගැනීම සඳහා කට්ටුක්කුලම ගොවි සංවිධානය සමඟ රු.1,695,000 ක ගිවිසුමකට එළඹී තිබුණු අතර, එම ගිවිසුම අනුව, එදින සිට දින 60 කින් කොන්ත්‍රාත්තුව නිමකර භාර දිය යුතු වුවද, 2020 ජූලි 20 දින වන විටද, කොන්ත්‍රාත්තුවේ වැඩ ආරම්භ කර නොතිබුණි. | එකඟ වෙමි.<br><br>පැවැති අධික වර්ෂාපතනය නිසා අපේක්ෂිත කාලසීමාව තුල ව්‍යාපෘතිය නිම කිරීමට හැකිවී නැත. | ගිවිසුම් ගත කාලය තුල ඉදිකිරීම් නිම කිරීම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මූතූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සපිරිගමක් ව්‍යාපෘතිය යටතේ ප්‍රතිපාදන ග්‍රාම නිලධාරි වසම් 3 ක පානය කිරීම සඳහා සුදුසු ජල නල මාර්ග එලීම සඳහා රු.3,462,632 ක් ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලයට ගෙවා ඇති නමුත් අදාල ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි. | එකඟ වෙමි<br><br>එම කාලවකවානුව තුල කොරෝනා ව්‍යයසන තත්ත්වය ව්‍යාප්තවීම නිසා අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගැනීමේ අපහසුතාවක් නිසා ඇතැම් කොටස් ප්‍රමාද වී ඇත. | ගිවිසුම් ගත කාලය තුල ඉදිකිරීම් නිම කිරීම කළ යුතුය. |

3.2 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම
---------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සපිරිගමක් ව්‍යාපෘතිය යටතේ ප්‍රතිපාදන වෙන් වී තිබූ රු.1,000,000 ක ව්‍යාපෘති 2 ක් සමාලෝචිත වර්ෂයේ නිම නොකර අත්හැර දමා තිබුණි. | එකඟ වෙමි<br>මාර්ග සංවර්ධන අධිකාරියේ සංවර්ධන කටයුත්තක් සඳහා මාර්ගය කඩා තිබූ බැවින් අමුද්‍රව්‍ය අදාල ස්ථානයකට ගෙන යාමට නොහැකි විය. | ව්‍යාපෘති සැළසුම් කර ක්‍රමවත්ව සිදු කළ යුතුය. |

3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්
--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ජාතික සමඟිය හා සංහිඳියාව සඳහා වන කාර්යාල ව්‍යාපෘති යටතේ ආහාර සැකසීමේ මධ්‍යස්ථාන හා ගබඩාව ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව හා ආහාර සැකසුම් මධ්‍යස්ථානයේ සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව 2019 සැප්තැම්බර් 18 දින ප්‍රාදේශීය ලේකම් විසින් තිරියාය ග්‍රාම සංවර්ධන සමිතිය සමඟ අත්සන් | එකඟ වෙමි<br><br>කොරෝනා වසංගත තත්වය හේතුවෙන් කොට්ඨාසයේ සිදුකල සියළුම ව්‍යාපෘති ක්‍රියාත්මක වීම ඉතා මන්දගාමීව සිදු වූ අතර කොට්ඨාසයට පැවති අධික වර්ෂාවත් සමඟ නැවතත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට බාධා ඇති විය. | ගිවිසුම් කාලය තුල ඉදිකිරීම් වැඩ නිම කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කරන ලද රු.1,455,000 ක් හා රු.485,000 ක් වටිනාකමැති කොන්ත්‍රාත්තු 2019 දෙසැම්බර් 17 දින වන විට වැඩ අවසන් කළ යුතු වුවත්, විගණිත දිනය වන 2020 සැප්තැම්බර් 10 දින වන විටත්, එම කොන්ත්‍රාත්තු 2 හි වැඩ අවසන් කර නොතිබුණි. | | |
| (ආ) | කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ කාර්යසාධන බලකා ව්‍යාපෘතිය යටතේ රු.1,960,000 ක් වූ සෙන්තූර් පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම (පළමු අදියර) කොන්ත්‍රාත්තුව ඉටුකර ගැනීම සඳහා 2019 අගෝස්තු 28 දින කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් විසින් පදවික්කාට්ටු කාන්තා ග්‍රාම සංවර්ධන සමිතිය සමඟ ගිවිසුමකට එළඹී තිබුණු අතර එම ගිවිසුමට අනුව 2019 නොවැම්බර් 27 දින වැඩ නිම කළ යුතු වුවත්, 2020 සැප්තැම්බර් 10 දින වන විටත් එම වැඩ නිම කර නොතිබුණි. | එකඟ වෙමි<br>2019-12-31 දින වන විට එම ව්‍යාපෘතියේ වැඩ කටයුතු අවසන් කිරීමට නොහැකි වූ හෙයින් අවිච්ඡින්න කාර්යක් සේ කරගෙන යාමට ඉල්ලීමක් කළ ද අනුමැතිය නොලැබීම නිසා ව්‍යාපෘතිය නිම කිරීමට හැකි වී නැත. | ගිවිසුම් කාලය තුල ඉදිකිරීම් වැඩ නිම කිරීමට කටයුතු කළ යුතුය. |

3.4 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන ජාතික සමගිය හා සංහිඳියාව සඳහා වන කාර්යාල ව්‍යාපෘතිය යටතේ රු.1,455,000 වටිනාකමැති ආහාර සැකසීමේ මධ්‍යස්ථාන හා ගබඩාව ඉදිකිරීමේ කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි අංක 07 අනුව, ගෙවීම් සඳහා මුළු වැඩ වලින් සියයට 90 ක් සම්පූර්ණ කර තිබිය යුතු වුවත්, 2020 සැප්තැම්බර් 10 දින වන විට මෙම කොන්ත්‍රාත්තුවේ භෞතික ප්‍රගතිය සියයට 50 ක් ව තිබීයදී 2020 ජුලි 10 දින කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 40 ක් වන රු.579,080ක් ගෙවීම්කර තිබුණි. | එකඟ වෙමි.<br><br>ව්‍යාපෘති වල බොහෝමයක් කොටස් නිමකර බිල්පත් කාර්යාලයට ලැබී ඇති අතර අනෙක් කොටස බැරකම් ලෙස දක්වා ඇත. අත් මුදල් නොලැබීමෙන් ගෙවීම් ප්‍රමාද වී ඉතිරි වැඩ සම්පූර්ණ කිරීම ප්‍රමාද වී ඇත | ගිවිසුමේ කොන්දේසි අනුව ගෙවීම් සිදු කල යුතුය. |

3.5 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගෝමරන්කඩවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව හෙක්ටයාර 0.6707 ක් වූ ඉඩම කැඩැස්තර සිතියම් අංක 260190 යටතේ කැබලි අංක 78 මඟින් 2016 දෙසැම්බර් 26 දිනැතිව මැනුම් කටයුතු අවසන් කර විගණන දින වූ 2021 පෙබරවාරි වන විට වසර 4 ක් ඉක්මවා තිබුණද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ඉඩමේ අයිතිය පවරා ගැනීම සිදු කර නොතිබුණි. | එකඟ වෙමි<br><br>ගෝමරන්කඩවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු ඉඩම් පවරාගැනිම මාස 03 ක් ඇතුලත අවසන් කිරිමට කටයුතු සිදු කරන බව කාරුණිකව දැනුම් දෙමි. | ඉඩමේ අයිතිය කඩිනමින් පවරා ගත යුතුය. |
| (ආ) | කන්තලේ, මූතූර් සහ සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් වාහන 12 ක අයිතිය ප්‍රාදේශීය ලේකම් වෙත පවරාගෙන නොතිබුණි. | එකඟ වෙමි.<br>මෙම වාහන ප්‍රාදේශීය ලේකම් වෙත පවරා ගැනීමක් සිදු කල නොහැකි අතර එම කටයුතු සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත යොමුකරන ලෙස ප්‍රාදේශීය ලේකම්වරුන්ට උපදෙස් ලබා දී ඇත. | වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

3.6 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019/20 මහ කන්නයේ වී අස්වනු මිලදී ගැනීමේ කඩිනම් වැඩ පිළිවෙල යටතේ වී මිලදී ගැනීමේදී කන්තලේ, තඹලගමුව හා සේරුවිල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ගොවීන්ගෙන් වී මිලදී ගෙන රැස්කර වී ඇඹරුම්හල් වෙත නිකුත් කිරීමේ දී එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පිළිවෙලින් වී කිලෝ ග්‍රෑම් 821, කිලෝ ග්‍රෑම් 8072, කිලෝ ග්‍රෑම් 28457 ක් වශයෙන් රු.1,868,000 ක වටිනාකමැති වී තොග අඩු තිබුණි. | මෙය ස්වාභාවිකව වුවක් සහ දුඹුරුපැල තණ කොල පෙත්තාගෙන් වූ හානියක් බව මෝල් හිමියන් ප්‍රකාශ කල අතර මේ පිළිබඳ විමර්ෂණය කිරීමට පත්කල කමිටුව විසින් ලබාදුන් නිර්දේශ කෘෂිකර්ම අමාත්‍යාංශයේ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට ඉදිරිපත් කර ඇත. | ජනාධිපති කාර්යාල චක්‍රලේඛය අනුව ගැටළුව පිළිබඳ විමර්ෂණයක් සිදුකර කඩිනම් පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නිකුත් කළ වී වලින් සහල් කිරීමේ ප්‍රතිශතය කීරි සම්බා සඳහා සියයට 60 ක්ද අනෙකුත් වර්ග සඳහා සියයට 65 ක් සේ සළකා අදාළ සහල් ප්‍රමාණය ගණනය කර ලංකා සතොස ආයතනයේ ආසන්නතම ගබඩා වෙත භාරදීමට දෙවන පාර්ශවකරු එකඟ විය යුතු වුවද ඉහත ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් ඇඹරුම්හල් වෙත ලබා දී තිබුණු වී තොග ප්‍රමාණයෙන් කන්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කිලෝ 75,130 සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කිලෝ 3,465 හා තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කිලෝ 2,939 ක් වශයෙන් රු.8,319,959 ක් වූ සහල් තොග අඩුවෙන් ඉහත ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලැබී තිබුණි. | බර අඩුවීමෙන් වූ පාඩුව අයකර ගැනීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට පත්කළ මණ්ඩලය විසින් ලබා දී ඇති නිර්දේශ කෘෂිකර්ම අමාත්‍යාංශයේ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබේ. එම අනුමැතිය ලැබුණු පසු අවශ්‍ය පරිදි කටයුතු කෙරෙනු ඇත. | ජනාධිපති කාර්යාල චක්‍රලේඛය අනුව ගැටළුව පිළිබඳ විමර්ෂණයක් සිදුකර කඩිනම් පියවර ගත යුතුය. |

## 3.7 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මියගිය විශ්‍රාමිකයින් සම්බන්ධයෙන් මාසික වාර්තාවන් සෑම මසකම පළමු සතියේ බදාදා දින අදාළ අංශ වෙත ලබා දෙන ලෙස ප්‍රාදේශීය ලේකම් විසින් සියළු ග්‍රාම නිලධාරීන් වෙත ඔවුන්ගේ රාජකාරී ලැයිස්තුව මඟින් දන්වා තිබුණු නමුත් මිය ගිය විශ්‍රාමිකයින් සම්බන්ධයෙන් ඇතැම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල 2020 වර්ෂයට අදාළව එම මාසික වාර්තා නිසි පරිදි ලබා නොදීම හේතුවෙන් ඔවුන්ට සිදු කරන විශ්‍රාම වැටුප් ගෙවීම නිසි පරිදි සිදු කිරීමට නොහැකි වී තිබුණි. | එකඟ වෙමි<br><br>මියගිය විශ්‍රාමිකයන් සම්බන්ධයෙන් වන මාසික වාර්තා ඉදිරියේ දී නියමිත දිනට ලබා දෙන ලෙස ප්‍රාදේශීය ලේකම්වරුන් හරහා ග්‍රාම නිලධාරීන් වෙත දැනුවත් කර ඇත. | අභ්‍යන්තර චක්‍රලේඛ හා රාජකාරි ලැයිස්තු වල සඳහන් උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කොවිඩ් 19 හේතුවෙන් ජන ජීවිතය පවත්වාගෙන යාමට අපහසු වූ පවුල් සඳහා රු.5,000 දීමනාව සඳහා 2020 වර්ෂය තුලදී කරන ලද ගෙවීම් පිලිබඳව නගර සහ කඩවත්, කින්නියා, තඹලගමුව සහ කන්තලේ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04 හි සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | එක් පවුලකට මාසයකට එක් වරක් පමණක් ගෙවිය යුතු මෙම සමාජ ප්‍රතිලාභ දීමනාව, විවිධ ලැයිස්තුවලින් එක් වරකට වඩා ගෙවා තිබීම නිසා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04 හි අවස්ථා 861 කදී රු.4,305,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. | දැනටමත් දෙවරක් ගෙවා ඇති දීමනා නැවත අයකරගෙන ඇත. | දීමනා ගෙවීම චක්‍රලේඛ විධිවිධාන අනුව නිවැරදිව සිදුකළ යුතුය. |
| (ii) | 2020 අප්‍රේල් 17 හා 2020 අප්‍රේල් 03 දිනැති අග්‍රාමාත්‍ය ලේකම්ගේ චක්‍රලේඛ අංක PTF/03/2020(III) හා PTF/03/2020(I) චක්‍රලේඛ වලට පටහැනිව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4කට අදාළව ප්‍රතිලාභීන් 527 ක් සඳහා එකතුව රු.5,255,000 ක් ගෙවා තිබුණි. | නැවත අයකර ගැනීමට කටයුතු කර ඇත. | දීමනා ගෙවීම චක්‍රලේඛ විධිවිධාන අනුව නිවැරදිව සිදුකළ යුතුය. |
| (iii) | කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සමෘද්ධි ලාභීන්ගේ ලේඛණය අනුව ප්‍රතිලාභීන් සඳහා රු.5,000 දීමනාව ගෙවීමේදී ගෙවිය යුතු සංඛ්‍යාව 1,519 වුවත් එම ප්‍රමාණයට වඩා වැඩිපුර රු.1,275,000 ක් සමෘද්ධි සංවර්ධන නිලධාරීන් හා සමෘද්ධි ගම්මාන සමිති වෙත අවස්ථා 10 කදී ලබා දී තිබුණි. | එකඟ වෙමි<br><br>ග්‍රාමීය කමිටු සාමජිකයින් සමිති සමාජිකත්වය දැරීම හේතුවෙන් මෙම තත්ත්වය උද්ගත වී ඇත. ඉදිරියේදී එවැනි වැරදි සිදු නොකරන ලෙස ට දන්වා ඇත. | ප්‍රතිලාභීන්ගේ සත්‍ය ලේඛණ මත ගෙවීම් කල යුතුය. |

4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසාර ඉලක්කයන් පිළිබඳ නිලධාරීන් ප්‍රමාණවත් පරිදි දැනුවත් වී නොතිබුණු අතර තිරසාර සංවර්ධන ඉලක්කයන් හඳුනා ගැනීම සිදුවී නොමැති නිසා සමාලෝචිත වර්ෂයේ ඉලක්කයන් සපුරා ගැනීම පිළිබඳ ඇගයීමක් කිරීමට නොහැකි විය. | එකඟ වෙමි. තිරසාර සංවර්ධන ඉලක්කයන් පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීමට ඉදිරියේදී කටයුතු කර දිස්ත්‍රික්කයට අදාලව තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ඒවා සපුරා ගැනීමට කටයුතු කරනු ලැබේ. | තිරසාර සංවර්ධන ඉලක්කයන් හඳුනා ගෙන ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතුය |

5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් නිළධාරි තනතුරු පුරප්පාඩු 18 ක්ද තෘතික මට්ටමට අයත් නිළධාරි තනතුරු පුරප්පාඩු 19 ක්ද ද්විතික මට්ටමට අයත් නිළධාරි තනතුරු පුරප්පාඩු 166 ක් හා ප්‍රථමික මට්ටමට අයත් නිළධාරි තනතුරු පුරප්පාඩු 35 ක්ද වශයෙන් මුළු පුරප්පාඩු ප්‍රමාණය 238 ක් විය. | එකඟ වෙමි අදාල පුරප්පාඩු තනතුරු පිරවීම සඳහා අවස්ථා ගණනාවකදී ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ඉල්ලීම් කර ඇත | අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ආ) | ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ජ්‍යෙෂ්ඨ, තෘතීය සේවා වර්ගයේ නිලධාරීන් සේවයේ යෙදවීම අත්‍යවශ්‍ය වුවද සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2018 වර්ෂයේ සිට සහකාර ප්‍රාදේශීය ලේකම් තනතුර, පරිපාලන නිලධාරී තනතුර හා පරිපාලන ග්‍රාම නිලධාරී තනතුර වසර 3 ක සිට පුරප්පාඩු පවතින බව හා තාක්ෂණික නිලධාරී තනතුර 2019 වර්ෂයේ සිට වසර 2 ක් පුරප්පාඩු වී තිබුණි. | එකඟ වෙමි අදාල පුරප්පාඩු තනතුරු පිරවීම සඳහා අවස්ථා ගණනාවකදී ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ඉල්ලීම් කර ඇත. | අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමට කඩිනම් පියවර ගත යුතුය. |